# මහ ලේකම්

**--**

# ලෝක වනජීවී දින පණිවිඩය

**<u>2022 මාර්තු 3</u>**

සෑම වසරකම, ලෝක වනජීවී දිනයේ දී, අපි අපේ පෘථිවියේ වන ශාක හා සතුන්ගේ සුන්දරත්වය හා ආශ්චර්යය සමරන්නෙමු

අපි වනජීවීන් ගැන සැලකිලිමත් වන්නේ ඇයි?

පෘථිවිය පවත්වාගෙන යාමේ සදාචාරාත්මක යුතුකමකින් ඔබ්බට, මානව වර්ගයා රඳා පවතින්නේ ස්වභාවධර්මය විසින් සපයනු ලබන ආහාර සහ මිරිදිය පටන් දූෂණය පාලනය කිරීම සහ කාබන් ගබඩා කිරීම දක්වා අත්‍යවශ්‍ය නිෂ්පාදන සහ සේවාවන් මත ය.

ස්වභාවික ලෝකයට හානි කිරීමෙන් අප අපේම යහපැවැත්මට තර්ජනයක් වෙයි.

අද වන විට ලොව පුරා වන සතුන් අනතුරට පත්ව ඇත.

විශේෂ අතරින් හතරෙන් එකක් වඳවී යාමේ තර්ජනයට මුහුන පා සිටින්නේ ඔවුන් ජීවත් වන පරිසර පද්ධතිවලින් අඩකට ආසන්න ප්‍රමාණයක් අප විසින් විනාශ කර ඇති බැවිනි. මෙම ප්‍රවණතාවය ආපසු හැරවීමට අප දැන් ක්‍රියා කළ යුතුයි.

මෙම වසරේ ලෝක වනජීවී දිනය පරිසර පද්ධති ප්‍රතිසංස්කරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ දශකයේ (2021-2030) වැදගත්කම ඉස්මතු කරයි.

පරිසර පද්ධති සෞඛ්‍ය සම්පන්න වන්නේ ඒවායේ සංඝටක වන විශේෂයන් වර්ධනය වූ විට පමණි.

එක් මූලික විශේෂයක් පමණක් අතුරුදහන් වුවහොත්, සමස්ත පරිසර පද්ධතියම පරිහානියට හා මිය යාමට පටන් ගත හැකිය.

එක් එක් විශේෂ ආරක්ෂා කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සමස්ත පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය කිරීම සමඟ අත්වැල් බැඳ ගත යුත්තේ එබැවිනි.

මෙම ලෝක වනජීවී දිනයේ දී අපගේ අමිල සහ ප්‍රතිස්ථාපනය කළ නොහැකි වන ජීවීන් වත්මන් සහ අනාගත පරපුරේ ප්‍රයෝජනය සහ සතුට සඳහා සංරක්ෂණය කිරීමට කැප වෙමු.